ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය Business & Accounting Studies

60 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2016 ජූලි
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை,2016 டிசெம்பர்
Genaral Certificate of Education (Ord. Level) Examination, July 2016

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II
வணிகக் கல்வியும் கணக்கீடும் I, II
Business and Accounting Studies I, II

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

- ❖ පළමුවන ප්‍රශ්නය ඇතුලු සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- ❖ පිළිතුරු පැහැදිලි අත් අකුරින් ලියන්න.

01. කතරගම ප්‍රදේශයේ දේවාලයක් අසල පළතුරු වට්ටි ඉල්ලුම අධීක්ෂණය කළ සුමනදාස විසින් පළතුරු මිලට ගෙන අළෙවි කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කළේ ය. මේ සඳහා ඔහු විසින් විවිධ ප්‍රදේශවල පළතුරු නිෂ්පාදකයන්ගෙන් පළතුරු මිලදී ගන්නා අතර අදාල ප්‍රවාහන කටයුතු තම ලොරි රථය යොදා ගෙන සිදු කරනු ලැබේ. මෙම ව්‍යාපාරය "සුමන පළතුරු වෙළෙඳ සැල" ලෙස නම් කරන ලද අතර ව්‍යාපාර කටයුතු කරගෙන යාමේ දී සිය බිරිඳගේ සහය ද ලබා ගනී.

සුමනදාස කතරගම මහජන බැංකුවේ ජංගම ගිණුම් හිමිකරුවෙකි. ඉතා විශ්වාසවන්ත ගනුදෙනුකරුවෙකු වන මොහු ට බැංකුවේ ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය යටතේ 10% බැංකු ණය, රු. 30,000 අනුමත වී ඇත. මොහු 2015.01.01 දින එම ණය මුදල, තමා සතුව තිබූ රු. 50,000 ක මුදල ද රු. 120,000 ක් වටිනා මෝටර් රථය ද යොදා ව්‍යාපාරය ආරම්භ කරන ලදි.

2015.01.03 අත්පිට ගැණුම් රු. 30,000
2015.01.05 ණයට ගැණුම් රු. 10,000
2015.01.07 අත්පිට විකුණුම් රු. 25,000
2015.01.20 කඩකුලි රු. 3,000
2015.01.31 ජල හා විදුලි බිල රු. 1,500

ජනවාරි මාසයට අදාල පහත තොරතුරු ද සපයා ඇත.
2015.01.31 දිනට තොගය රු. 15,000
මාසය සඳහා ලොරි රථයේ ක්ෂය රු. 1,000

i. සුමන වෙළෙඳ සැල අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය නම් කර, එහි වාසියක් හා අවාසියක් බැගින් ලියන්න.
ii. මෙම ව්‍යාපාරය ලියාපදිංචි කිරීම අනිවාර්ය වේ ද? නොවේ ද ? පැහැදිලි කරන්න.
iii. මෙය කුමන වෙළෙඳාම් වර්ගයකට අයත් වේ ද? එහි ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.
iv. මෙම ව්‍යාපාරයට අදාල බෙදාහැරීම් ක්‍රියාවලිය කුමක් ද ?
v. ව්‍යාපාරය ආරම්භයේ සිදු වූ ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයක දක්වන්න.
vi. 2015 ජනවාරි මාසය සඳහා සුමන ව්‍යාපාරයේ මුදල් පොත පිළියෙල කරන්න.
vii. මෙම ව්‍යාපාරයේ පිළියල කළ හැකි මූලික පොත් දෙකක් නම් කරන්න.
viii. ජනවාරි මාසය අවසානයේ දැකිය හැකි ජංගම වත්කම් 2 ක් හා එහි වටිනාකම් සහිතව ලියා දක්වන්න.
ix. මෙම ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනු අතරින් වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් ගිණුම් වලට නිදසුන බැගින් දෙන්න.
x. සුමනදාස ගෙවිය යුතු වාර්ෂික ණය පොලිය කීය ද?

*(ලකුණු 02 x 10 = 20 යි)*

## I **කොටස - ව්‍යාපාර අධ්‍යයනය**

**(ප්‍රශ්ණ සියල්ලට ම පිළිතුරු සපයන්න.)**

02. i. අවශ්‍යතා හා වුවමනා වල ලක්ෂණ 2 බැගින් ලියන්න.

ii. පහත දැක්වෙන ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

- ❖ ප්‍රාග්ධනය නිෂ්පාදන සාධකයකි.
- ❖ තොග වෙළෙඳ ආයතන, සිල්ලර වෙළෙඳ ආයතන භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර වේ.
- ❖ විදේශීය ප්‍රාග්ධනය රට තුළට ගලා ඒම දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් සිදුවන අහිතකර බලපෑමකි.
- ❖ සේවකයන්ගේ විශේෂිත දැනුම හා කැපවීම ව්‍යාපාරයක ශක්තියකි.

iii. අයිතිය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කරන ගැලීම් සටහන ඇඳ දක්වන්න.

iv. රාජ්‍ය දෙපාර්තමේන්තුවක වාසි හා අවාසි 2 බැගින් ලියන්න. *(ලකුණු 08 යි)*

03. i. කළමණාකරණ කාර්යයන් නම් කරන්න.

ii. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න ඉදිරියෙන් දක්වන්න.

- ❖ ව්‍යාපාර අරමුණු අපේක්ෂිත අයුරින්ම ඉටුකර ගැනිම සඵලදායිත්වය නම් වේ.
- ❖ යම් භාණ්ඩයක් හෝ සේවාවක් වෙනුවෙන් පාරිභෝගිකයාගෙන් අයකිරිමට අපේක්ෂිත වටිනාකම අලෙවිකරණයේ දි ප්‍රවර්ධනය ලෙස හඳුන්වයි.
- ❖ දේපළ රක්ෂණ ඔප්පුවක වටිනාකම දේපල වල මූල්‍යමය වටිනාකම අනුව තීරණය වේ.
- ❖ අභ්‍යන්තර සන්නිවේදනයේ දී යවන්නා හා ලබන්නා අතර සාපේක්ෂව වැඩි දුරක් පවති.

iii. ස්වරූපය අනුව වර්තමානයේ වර්ග කල හැකි සිල්ලර වෙළෙඳ සැල් මොනවා ද?

iv. දුම්රිය පරිවහනයේ වාසි හා අවාසි 2 බැගින් සඳහන් කරන්න. *(ලකුණු 08 යි*

## II **කොටස - ගිණුම්කරණය**

**(ප්‍රශ්ණ සියල්ලට ම පිළිතුරු සපයන්න.)**

04. අ. රුවිදු ගේ ව්‍යාපාරයේ 2016 ජනවාරි මාසයේ මුල් සතියේ සිදු වු ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

i. 2016.01.01 ප්‍රාග්ධනය යොදුවා රු 250,000

ii. අත්පිට මුදලට භාණ්ඩ විකුණා රු. 40,500

iii. විදුලිබිල ගෙව්වා රු. 3,100

iv. බැංකු ණයක් ගත්තා රු. 125,000

v. අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනයට ගත්තා රු. 8,000

ඉහත ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය දක්වන්න. ඒ සඳහා පහත ආකෘතිය භාවිත කරන්න.

(1) ගනුදෙනුව සටහන් කරන ආකාරය නිදසුන් ලෙස දක්වා ඇත.

| **ගනුදෙනු අංක** | **වත්කම්** = | **හිමිකම්** + | **වගකීම්** |
|---|---|---|---|
| 01 | මුදල්<br>+ 250,000 | ප්‍රාග්ධනය<br>+ 250,000 | |
| 02 | | | |
| 03 | | | |
| 04 | | | |
| 05 | | | |

*(ලකුණු 04 යි)*

ආ. සේව්මිණිගේ ව්‍යාපාරයේ 2016 මාර්තු මාසයේ සිදු වූ සුළු වියදම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | |
|---|---|---|
| 2016.03.01 | අග්‍රිමය ලැබුණා | රු. 2,500 |
| 03.08 | කුලී රථ ගාස්තු | රු. 200 |
| 03.14 | ලිපිද්‍රව්‍ය ගාස්තු | රු. 150 |
| 03.16 | ගෙනඒමේ කුලි | රු. 250 |
| 03.19 | සංග්‍රහ ගාස්තු | රු. 175 |
| 03.22 | කම්කරු ගාස්තු | රු. 225 |
| 03.23 | බස් ගාස්තු | රු. 180 |
| 03.26 | අභ්‍යාස පොත් | රු. 110 |
| 03.28 | බීම සඳහා | රු. 190 |
| 03.29 | පරිත්‍යාග | රු. 300 |
| 03.30 | උපකරණ | රු. 600 |

*(ලකුණු 04 යි)*

**අවශ්‍ය වන්නේ,**

ගමන් වියදම්, ලිපිද්‍රව්‍ය වියදම්, සංග්‍රහ වියදම් හා විවිධ වියදම් යන විශ්ලේෂණ තීරු සහිත සුළු මුදල් පොතක් පිළියෙල කරන්න.

ඉ. 2016 පෙබරවාරි 29 දිනට සුරත් ගේ ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය රු. 28,600 ක් විය. එහෙත් එදිනට බැංකු ප්‍රකාශයේ සඳහන් වටිනාකම එයට වෙනස් විය. වෙනසට හේතු වශයෙන් පහත සඳහන් කරුණු අනාවරණය විය.

1. ණයහිමියන්ට නිකුත් කළ මුත් ගෙවීමට මෙතෙක් බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත් රු. 8,500 යි.
2. බැංකු ගාස්තු රු. 1,200 ක් බැංකුව අයකරගෙන ඇත.
3. ණයගැතියන්ගෙන් ලැබී බැංකුවේ තැන්පත් කරන ලද රු. 9,400 චෙක්පත් මෙතෙක් බැංකුව බැර කර නොමැත.
4. ණයගැතියෙකු කෙලින්ම බැංකුවේ තැන්පත් කරන ලද මුදල රු. 5,200 කි.

**අවශ්‍ය වන්නේ,**

අ. බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම

ආ. 2016 පෙබරවාරි 29 දිනට බැංකු සැසඳුම් විස්තරය පිළියෙළ කර එදිනට බැංකු ප්‍රකාශයේ ශේෂය දැක්වීම.

*(ලකුණු 04 යි)*

05. අ. නාතාෂාගේ ව්‍යාපාරයේ 2016.01.31 දිනට පිළියෙල කල ශේෂ පිරික්සුමේ එකතුව සමාන නොවූ අතර වෙනස වූ රු. 11,900 අවිනිශ්චිත ගිණුමකට බැර කරන ලදි. පසුව කළ පරීක්ෂාවේ දි පහත වැරදි අණාවරණය විය.

1. රු. 6,000 ක විකුණුම් ඉන්වොයිසියක් පොත්වල දෙවරක් සටහන් වීම.
2. රු. 2,000 ක විදුලි ගාස්තු ගෙවීම පොත්වල සම්පූර්ණයෙන් ම සටහන් වී නොතිබීම.
3. රු. 9,000 ක රක්ෂණ ගාස්තු ගෙවීම, රක්ෂණ ගාස්තු ගිණුමේ සටහන් වී ඇත්තේ රු. 900 ක් ලෙස ය.
4. ලද ගෙවල් කුලී රු. 10,000 මුදල් පොතේ නිවැරදිව සටහන් කර ඇතත් ගෙවූ ගෙවල් කුලී ගිණුමට හර කර ඇත.

**අවශ්‍ය වන්නේ,**

අ. ඉහත වැරදි නිවැරදි කිරීමට අදාල ජ'නල් සටහන්

ආ. අවිනිශ්චිත ගිණුම පෙන්වන්න. *(ලකුණු 04 යි)*

ආ. කාවිංගගේ ව්‍යාපාරයේ 2015.12.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

**ශේෂ පිරික්සුම**

| | | |
|---|---|---|
| ගොඩනැගිලි | 780,000 | |
| 2015.01.01 තොගය | 14,000 | |
| දුන් වට්ටම් | 2,000 | |
| රක්ෂණය | 4,300 | |
| ප්‍රචාරණය | 16,000 | |
| ලද වට්ටම් | | 15,600 |
| විකුණුම් | | 332,000 |
| තොග හානි | 2,000 | |
| උපකරණ - පිරිවැයට | 60,000 | |
| ගැණුම් | 210,500 | |
| 15% බැංකු ණය | | 100,000 |
| බැංකු ණය පොලිය | 10,000 | |
| මුදල් | 28,100 | |
| ණයගැතියෝ | 23,000 | |
| ණයහිමියෝ | | 36,000 |
| 2015.01.01 දිනට උපකරණ ක්ෂය වෙන් කිරීම | | 14,000 |
| 2015.01.01 දිනට ප්‍රාග්ධනය | | 652,300 |
| | 1,149,900 | 1,149,900 |

**අමතර තොරතුරු**

1. 2015.12.31 දිනට ඉතිරි තොගය රු. 16.000
2. උපචිත ප්‍රචාරණ ගාස්තුව රු. 2,000
3. ණයගැතියන්ගෙන් රු. 3,000 බොල්ණය ලෙස කපා හැරිය යුතුය.
4. උපකරණ වාර්ෂිකව පිරිවැය මත 10% බැගින් ක්ෂය කළ යුතුය.

**අවශ්‍ය වන්නේ,**

අ. 2015.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශණය

ආ. 2015.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශණය පිළියෙල කරන්න. *(ලකුණු 08 යි)*

සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක

සිසිර කුමාර

විසින් සම්පාදිත යි.